# ශ්‍රී ලංකාවේ සංස්කෘත අභිලේඛනගත වචන පිළිබඳ වාග්විද්‍යාත්මක අධ්‍යයනයක්: කුච්චවේලි සංස්කෘත සෙල්ලිපිය ඇසුරින්

බටකන්දේ රාහුල හිමි[1]

ශ්‍රී ලංකාවේ දැනට හමු වී ඇති හාරදහසක් පමණ සෙල්ලිපි අතර සංස්කෘත සෙල්ලිපි දක්නට ලැබෙන්නේ විස්සක් පමණි. ඒ සෙල්ලිපි ඇසුරින් ශ්‍රී ලංකාවේ සංස්කෘත භාෂා භාවිතය පිළිබඳ අධ්‍යයනයක් කළ හැකි ය. භාෂා ඉතිහාසය හැදෑරීමේ දී අභිලේඛන ප්‍රධානතම මූලාශ්‍රයයක් ලෙස ඓතිහාසික වාග්විද්‍යාඥයෝ සලකති. ඉන්දු ආර්ය භාෂා අනුගණයෙහි සංස්කෘත භාෂාව ඓතිහාසික වටිනාකමක් සහිත සම්භාව්‍ය භාෂාවක් ලෙස සැලකේ. සංස්කෘත භාෂාවේ ඓතිහාසික භාෂා තත්ත්වය විමසීමේ දී කුච්චවේලී සෙල්ලිපිය ප්‍රමුඛ මූලාශ්‍රයයක් ලෙස සැලකිය හැකි ය. ක්‍රි. ව. 7 වැනි සියවසේ පමණ රචනා වූ එය දනට සොයාගෙන ඇති පැරැණිතම සංස්කෘත අභිලේඛනය යි. එහි අන්තර්ගතය සිවුපද ශ්ලෝක ද්වයයකින් සමන්විත ය. මේ සෙල්ලිපිය ඇසුරින් ක්‍රි. ව. 7 වැනි සියවසේ සංස්කෘත භාෂාවේ ස්වරූපය හඳුනාගත හැකි ය. සම්භාව්‍ය සංස්කෘතයට සම හා විසම භාෂා ලක්ෂණ ද එහි දක්නා ලැබේ. නූතන වාග්විද්‍යාත්මක ශික්ෂණවලට අනුව භාෂාවක් පිළිබඳ ව කෙරෙන කාලාපසාරී (Daichronic) අධ්‍යයනයක දී ඒ භාෂාවේ එක් අවධියක භාෂා ස්වරූපය හඳුනාගත හැකි ය. ක්‍රි. ව. 7 වැනි සියවසේ සංස්කෘත භාෂා අධ්‍යයනය කිරීම මෙහි ප්‍රධාන අරමුණ ය. සෙල්ලිපිය ඇසුරින් ලබගත් දත්ත පිළිබඳ ව සිදු කෙරන මේ විධිමත් ශාස්ත්‍රානුකූල විමර්ශනය දී ශබ්ද විද්‍යාත්මක (Phonology) පදිම විචාරාත්මක (Morphology) හා වාක්‍ය විචාරාත්මක (Syntax) ශික්ෂණවලට අනුගත වේ.

**ප්‍රමුඛ පදඃ** සංස්කෘත සෙල්ලිපි, කාලාපසාරී අධ්‍යයනය, සංස්කෘත භාෂාව, ශබ්ද විද්‍යාව, පදිම විචාරය, වාක්‍ය විචාරය

[1] සංස්කෘත අධ්‍යයනාංශය